**මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන (2020.12.31 දිනට)**

උපලේඛණය **: 01**

විවිධ තැන්පතු

| දිනය | වවුචර් අංකය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|---|
| 84.09.04 | 24 | විදුලි සංදේශ - වි. ස. තැන්පතු | 3,000 |
| 84.11.30 | 136 | කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කම්පැනි ලිමිටඩ් | 24,000 |
| 84.12.05 | 139 | කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කම්පැනි ලිමිටඩ් | 6,000 |
| 85.01.15 | 24 | විදුලි සංදේශ - තැන්පතු | 450 |
| 85.05.21 | 628 | විදුලි සංදේශ - තැන්පතු | 150 |
| 85.05.18 | 919 | විදුලි සංදේශ - තැන්පතු | 150 |
| 86.06.18 | 920 | විදුලි සංදේශ - තැන්පතු | 150 |
| 85.06.18 | 921 | විදුලි සංදේශ - තැන්පතු | 150 |
| 85.07.08 | 1091 | සිලෝන් බල්බ්ස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් | 80 |
| 85.08.05 | 1375 | විදුලි සංදේශ - තැන්පතු | 150 |
| 86.01.01 | 146 | විදුලි සංදේශ - තැන්පතු | 250 |
| 86.01.01 | 147 | විදුලි සංදේශ - තැන්පතු | 250 |
| 86.07.29 | 2017 | විදුලි සංදේශ - තැන්පතු | 150 |
| 86.07.24 | 1969 | කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කම්පැනි ලිමිටඩ් | 19,500 |
| 87.01.08 | 50 | විදුලි සංදේශ - තැන්පතු | 150 |
| 87.09.01 | 2851 | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 4,000 |
| 87.01.06 | 3287 | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 54,000 |
| 89.05.16 | 1869 | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 35,000 |
| 89.05.20 | 1984 | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 22,000 |
| 89.11.14 | 4225 | කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කම්පැනි ලිමිටඩ් | 25,000 |
| 89.12.28 | 4859 | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 8,500 |
| 89.12.28 | | ලංකා විදුලිබල මණ්ඩලය | 600,000 |
| 90.03.12 | 995 | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 15,000 |
| 90.08.29 | 3507 | කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කම්පැනි ලිමිටඩ් | 5,000 |
| 90.08.29 | 3372 | කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කම්පැනි ලිමිටඩ් | 25,000 |
| 91.04.29 | 1992 | විදුලි සංදේශ - තැන්පතු | 25,000 |
| 92.03.14 | 1219 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 16,053 |
| | | පෝස්ට් මාස්ටර් ජනරාල් - ෆ්‍රාංකන යන්ත්‍රය සඳහා තැන්පතු | 90,265 |
| 92.12.31 | 6070 | ලංකා විදුලිබල මණ්ඩලය | 1,672,000 |
| 90.03.12 | 1018 | කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කම්පැනි ලිමිටඩ් | 10,000 |
| 95.06.07 | 5965 | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 1,500 |
| 95.09.14 | 6063 | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 1,500 |
| 96.01.29 | 463 | වෛද්‍ය ජේ.බී. පීරිස් මහතා - ජාත්‍යාන්තර සෘජු ඇමතුම් සඳහා තැන්පතු | 5,000 |
| | 6497 | ශ්‍රී ජයවර්ධනපුර ; විවිධ සේවා සමූපකාර සමිතිය | 75,000 |
| 96.07.02 | 4934 | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 11,000 |
| | | සිලෝන් ඔක්සිජන් කම්පැනි ලිමිටඩ් | 500,000 |
| | | ලං.වි.බ. - උසස් හෘද මධ්‍යස්ථානය | 937,500 |
| | | ඒජන්සි තැපැල් කාර්යාලය | 10,000 |
| 2007 | | ශ්‍රී ජයවර්ධනපුර ; විවිධ සේවා සමූපකාර සමිතිය | 75,000 |
| 2016 | | ආපසු ගෙවන තැන්පතු - හිස් කන්ටේනර් සඳහා | 1,200,000 |
| | | ආපසු ගෙවන තැන්පතු - හිස් කන්ටේනර් සඳහා | 300,000 |
| 2018.7.23 | | ඇපැල් නඩුව - 33/1207/2015 / තැන්පතු | 1,619,225 |
| | | හෙද නේවාසිකාගාර තැන්පතු | 240,000 |
| | | කන්ටේනර් සඳහා තැන්පතු | 145,000 |
| | | | **7,782,123** |

**ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල**

**මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන (2020.12.31 දිනට)**

**උපලේඛනය : 02**
**අයවිය යුතු අනිකුත් ආදායම්**

| සමාගම | ප්‍රභේදය | වර්ෂය | මාසය | මුදල (රු.) | |
|---|---|---|---|---|---|
| හැටන් නැෂනල් බැංකුව | විදුලිය | | | | |
| | | 2020 | දෙසැම්බර් | 13,905 | 13,905 |
| ලංකා බැංකුව | විදුලිය | 2020 | නොවැ/දෙසැ | 46,832 | |
| | කුලිය | 2020 | දෙසැම්බර් | 20,000 | 66,832 |
| ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය | විදුලිය | 2009 | | 5,553 | |
| | | 2017 | | 31,457 | |
| | | 2019 | | 14,362 | |
| | | 2020 | ඔක්/නොවැ/දෙසැ | 8,678 | 60,050 |
| | කුලිය | 2020 | /දෙසැ | 10,000 | 10,000 |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | කුලිය | 2019 | අගෝ. සිට දෙසැ. දක්වා | 518,000 | |
| | | 2020 | | 425,000 | |
| | විදුලිය | 2020 | ඔක්/නොවැ/දෙසැ | 312,172 | 1,255,172 |
| පළතුරු යුෂ හල | | | | | |
| | විදුලිය | 2017 | දෙසැම්බර් | 9,415 | 9,415 |
| ආහාර වෙළඳසැල | කුලිය | 2020 | ඔක්/නොවැ/දෙසැ | 420,000 | |
| | විදුලිය | 2020 | ඔක්/නොවැ/දෙසැ | 54,339 | 474,339 |
| සිල්ලර වෙළඳසැල | කුලිය | 2020 | දෙසැම්බර් | 382,500 | |
| | විදුලිය | 2020 | නොවැ. / දෙසැ. | 93,527 | 476,027 |
| පේස්ට්‍රි වෙළඳසැල | කුලිය | 2020 | නොවැ. / දෙසැ. | 61,090 | |
| | විදුලිය | 2017 | දෙසැම්බර් | 3,702 | |
| | | | | | 64,792 |
| කොමර්ෂල් බැංකුව | කුලිය | 2020 | නොවැ. / දෙසැ. | 20,000 | |
| | විදුලිය | 2020 | නොවැ. / දෙසැ. | 20,378 | 40,378 |
| මහජන බැංකුව | විදුලිය | 2020 | ඔක්තෝබර්-දෙසැම්බර් | 19,607 | |
| | කුලිය | 2020 | දෙසැම්බර් | 15,000 | 34,607 |
| PayGo | කුලිය | 2020 | ජූනි - දෙසැම්බර් | 6,000 | 6,000 |
| මොබිටෙල් සමාගම | විදුලිය | 2019 | දෙසැම්බර් | 122,917 | 122,917 |
| | | | | | **2,634,434** |

ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල

**මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන (2020.12.31 දිනට)**

උපලේඛනය : **03**

විවිධ ණයගැතියන්

| විස්තරය | | රු. |
|---|---|---|
| ජේ.එන්.ඩී. සිල්වා - සේ.අ.අ. අංක 212 | 2015 | 72,180 |
| රත්නායක මිය - කාර්යමණ්ඩල හෙදවරිය - වැඩිපුර ගෙවන ලද පාරිතෝෂික | | 40,868 |
| රෝහල් පොලිසිය - ජෝශප් මහතා | | 43,151 |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - දේපළ ණය පොලිය | | 87,416 |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - දුරකථන දීමනා | | 60,000 |
| රාජ්‍ය ඔෟෂධ සංස්ථාව | | 20,000 |
| ශ්‍රී ලන්කන් කෙටරින් | | 925,000 |
| කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් අයකරගත යුතු වෛද්‍ය බිල්පත් | | 372,670 |
| | | **1,621,285** |

**ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල**

**මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන (2020.12.31 දිනට)**

**උපලේඛනය : 04**

**සිදුකෙරමින් පවතින ප්‍රාග්ධන වැඩ**

| ව්‍යාපෘති | 2020.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ ප්‍රාග්ධනිත මුදල | ගෙවීම් / රඳවා ගැනීම් | 2020.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරිම | 135,315,313 | | 39,466,404 | 174,781,717 |
| හෙද ගොඩනැගිල්ලක් ඉදිකිරිම | 372,474,774 | | 70,071,841 | 442,546,616 |
| ජලය සිසිල්කරණ යන්ත්‍රය - වායු පරිහරණ පද්ධතිය | 9,970,853 | | | 9,970,853 |
| පිරිමි හෙද ගොඩනැගිල්ලක් ඉදිකිරිම | 37,302,433 | | 9,159,355 | 46,461,788 |
| වැසිකිලි ඉදිකිරීම | 98,101,530 | | 13,964,426 | 112,065,956 |
| උණුසුම් ජල පද්ධතිය | 22,114,414 | | | 22,114,414 |
| වැඩමුළු ගොඩනැගිල්ල ඉදිකිරීම | 56,158,916 | | 7,255,527 | 63,414,444 |
| මූලික ලංසු ලේඛන - C E C B | 118,040 | | | 118,040 |
| රික්තක පද්ධති වායු නළ - OT/CU/ LR | 2,918,500 | | | 2,918,500 |
| සැලැස්ම අනුමත කිරීම - C Arm කාමරය | 8,907 | | | 8,907 |
| වැසිකිලි ICU | | | 2,494,294 | 2,494,294 |
| | **734,483,679** | **-** | **142,411,848** | **876,895,527** |

ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල

## මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන (2020.12.31 දිනට)

උපලේඛනය : **05**
උපචිත වියදම්

| විස්තරය | රු. |
|---|---:|
| භූමිදර්ශනය (Landscaping) | 1,070,063 |
| විදුලිය - ප්‍රධාන ගොඩනැගිල්ල | 11,450,000 |
| ජලය බිල්පත් | 3,409,281 |
| ආරක්ෂක සේවය | 3,755,623 |
| මළාපවහන ගාස්තු | 2,559,290 |
| ප්‍රතික්ෂේප කරන ද්‍රව්‍ය අපහරණය කිරීම - මෘත දේහ | 64,000 |
| රෙදි සේදීමේ සේවය | 1,450,000 |
| සන්නිවේදන ගාස්තු | 451,549 |
| මුද්දර ගාස්තු | 296,100 |
| රාජ්‍ය ඖෂධ සංස්ථා ඔසුසල | 28,563,494 |
| හිමිකම් නොපාන ලද අතිකාල | 2,688,127 |
| විවිධ වියදම් | 1,533,926 |
| අමු ආහාරපාන | 23,077,600 |
| පුද්ගල පාරිශ්‍රමික | 100,571,449 |
| සේ.අ.අ. සහ සේ.නි.භා.අ. | 31,095,925 |
| පවිත්‍රතා සේවා | 3,508,016 |
| ඉන්ධන | 116,549 |
| පිටස්තරින් සිදුකරනු ලබන රසායනාගාර පරීක්ෂණ ගාස්තු | 4,420,035 |
| සේවා කිරීම්, නඩත්තු සහ අළුත්වැඩියා කිරීම් | 17,808,929 |
| ලබා නොහත් නිවාඩු දීමනා | 22,000,000 |
| උපයනවිට ගෙවීමේ බදු | 3,296 |
| | **259,893,250** |

ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල

**මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන (2020.12.31 දිනට)**

උපලේඛනය **: 06**

කාර්යසාධන තැන්පතු

| | | | |
|---|---|---|---|
| මුදල් අයකැමිවරන් විසින් තබන ලද මුදල් තැන්පතු | | | |
| එන්. ලසන්ත | | 5,000.00 | |
| අයි.ජී. නන්දසිරි | | 5,000.00 | |
| ඩී. විතාන | | 5,000.00 | |
| ආර්.එම්.කේ.බී. ඒකනායක | | 5,000.00 | |
| ජී.එන්.පී. විජේරත්න - 2014 | | 5,000.00 | 25,000 |
| අබාන්ස් එන්වයර්මෙන්ටල් සර්විස් - ලංසු ඇපකරය | | | 5,000 |
| floor ෂයින් | | | 5,000 |
| ඩී.එච්.ජේ. වික්‍රමගේ | | | 2,500 |
| එච්.ඒ.ජී.එස්. කුමාර - (R/no 892161 - 1997.12.12) | | | 5,000 |
| රෝහල් වෙළඳසැල - (කුලී තැන්පතුව) | | | 96,407 |
| ඩී. Angelo | | | 413,100 |
| පෙරේරා ඇන්ඩ් සන්ස් - (කුලී තැන්පතුව - 2019) | | | 450,000 |
| ක්වික් ලිනන් වොෂින් - සුරක්ෂිත තැන්පතුව | 2019 | | 20,000 |
| සී zසෝන් කෝනර් වෙළඳසැල - කුලී තැන්පතුව - 2016 | | | 259,425 |
| වෙන්චර් සිලෝන් හෝල්ඩින්ස් - Q/27/18 - අපකර තැන්පතුව | | | 42,030 |
| | | | 1,323,462 |

ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල

**මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන (2020.12.31 දිනට)**

**උපලේඛනය : 07**
**විවිධ ණයහිමියෝ**

| විස්තරය | | රු. | රු. |
|---|---|---|---|
| පැලවත්ත සීනි සංස්ථාව | රෝහල් ගාස්තු සඳහා තැන්පතුව | | 25,000 |
| විදේශ ළමා පාසැල | රෝහල් ගාස්තු සඳහා තැන්පතුව | | 20,100 |
| ජාත්‍යන්තර වාරිමාර්ග - IIMI | රෝහල් ගාස්තු සඳහා තැන්පතුව | | 10,000 |
| ලංකා හෝටල් සංස්ථාව | රෝහල් ගාස්තු සඳහා තැන්පතුව | | 50,000 |
| ලංකා වෝල්ටයිල්ස් ලිමිටඩ් | රෝහල් ගාස්තු සඳහා තැන්පතුව | | 50,000 |
| ඩබ්ලිව්.ඒ.එස්. සමරසේන | උසාවි නඩුව සඳහා තැන්පතුව | | 20,379 |
| ඩර්ඩන්ස් රෝහල | හෘද් කපාට සඳහා තැන්පතුව | | 157,700 |
| රුධිර කාන්දුපෙරන අනුග්‍රාහක අරමුදල | | | 2,000 |
| වෛද්‍ය ආනන්ද පෙරේරා මහතා | විකලාංග වැඩමුළුව | | 43,000 |
| මුළුතැන්ගෙයි අදියර 02 | | | |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | | 689,754.80 | |
| CECB | | 67,200.00 | 756,955 |
| ගෙවිය යුතු පාරිතෝෂික | | | 230,675 |
| ගෙවිය යුතු පාරිතෝෂික - ටී.ඒ.එම්. පීරිස් - සේ.අ.අ. 1763 | | | 750 |
| ගෙවිය යුතු පාරිතෝෂික | | | 205,201 |
| NITF - රක්ෂණ වාරික | | | 148,775 |
| සිංගර් ශ්‍රී ලංකා - වැටුප් අඩුකිරීම් | | | 199,976 |
| රඳවා ගැනීම- DX වර්ගයේ වායු පරිහරණ පද්ධතිය | | | 3,395,000 |
| රඳවා ගැනීම- වාට්ටු සඳහා බිත්ති හරහා ඔක්සිජන් නළ (මෙඩි ටෙක්නොලොජි හෝල්ඩින්ස්) | | | 1,371,215 |
| ගෙවිය යුතු පාරිතෝෂික | | | 1,702,975 |
| වැටුප් අඩුකර ගැනීම - උපයනවිට ගෙවීම | | | 26,100 |
| වැටුප් අඩුකර ගැනීම - පාසැල් පොත් අත්තිකාරම් | | | 2,000 |
| | | | **8,417,801** |

ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල

**මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන (2020.12.31 දිනට)**

උපලේඛනය **: 08**

ගෙවිය යුතු වෘත්තීය ගාස්තු

| විස්තරය | රු. |
|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය | 3,616,142 |
| දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු | 48,062,975 |
| | **51,679,117** |

# 4. 9 කාර්ය සාධන වාර්තාව

| | සත්‍ය අගය Rs.'000 | පුරෝකථන අගය Rs.'000 | වෙනස |
|---|---|---|---|
| ආදායම | 5011110 | 4455624 | 12% |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 6223 | 7600 | -18% |
| ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රමක්ෂය කිරීම | 532946 | 400000 | 33% |
| | **5550279** | **4863224** | **14%** |
| පාවිච්චි කරන ලද ද්‍රව්‍ය සහ පරිභෝජ්‍ය | 1300727 | 1579128 | -18% |
| කාර්යමණ්ඩල පිරිවැය | 3000627 | 2897466 | 4% |
| ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂය කිරීම් | 532946 | 550500 | -3% |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 516302 | 513692 | 1% |
| | **5350602** | **5540786** | **-3%** |
| මෙහෙයුම් වලින් ලත් ලාභය (අලාභය) | 199677 | (677562) | -129% |
| මූල්‍ය පිරිවැය | 16175 | 16685 | -3% |
| අනෙකුත් වියදම් | 9705 | 24064 | -60% |
| බදු පෙර ලාභය(අලාභය) | **173796** | **(718311)** | **-124%** |
| ආර්ථික සේවා ගාස්තු | - | - | - |
| බදු පසු ලාභය(අලාභය) | **173796** | **(718311)** | **-124%** |

# 5. විගණන වාර්තා



# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එච්එස්එම්/බී/එස්ජේජීඑච්/ එෆ්ඒ/20/04 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2022 පෙබරවාරි 28 දින | | |

සභාපති
ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලා මණ්ඩලය

**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මහාරෝගාශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.මිලියන 10.26 ක් 2020 ජනවාරි 01 දින ඉදිරියට ගෙන ආ සමුච්චිත ඌනතාවයට හා රු.මිලියන 2.8 ක් අනෙකුත් සංචිත ශේෂයට ගලපා තිබුණි. මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන 2,901.52 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවත් මෙකී වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර එම වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39 (අ) ඡේදය ප්‍රකාරව, සේවා සැපයීමට අදාළ ගනුදෙනුවල අයභාර හඳුනාගැනීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 2,353.15 ක්වූ රෝහල් ගාස්තු (Hospital Charges) ගණනය කිරීම සඳහා අනුගමනය කරන ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී ඇඳඉහපත් 15 කට අදාළ ණයගැති හා නිදහස් රෝහල් වියදම් වටිනාකම නැවත නැවත රෝහල් පාලන ගිණුමට බැරකර තිබීම හේතුවෙන් රෝහල් ගාස්තු ආදායම රු.මිලියන 13.81 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු බව නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය.

(ඉ) 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු පාලන ගිණුමේ පැවති රු.මිලියන 4.23 ක හර ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු නොකර ඒ වෙනුවට එම ශේෂය රෝහල් නේවාසික ගාස්තු ආදායම් ගිණුමට මාරුකර තිබුණි. ඒ හේතුවෙන් රෝහල් නේවාසික ගාස්තු ආදායම ඊට සමාන අගයකින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඊ) වෘත්තිය ගාස්තු අයකිරීම් හා ආපසු ගෙවීම් නිසි පරිදි ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට වෘත්තිය ගාස්තු ගිණුමේ පැවති රු.මිලියන 62.64 ක හර ශේෂයට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කරනු වෙනුවට එම ශේෂය රෝහල් ගාස්තු පාලන ගිණුමට මාරුකර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 1998 වර්ෂයේ සිට පැවතෙන රු.මිලියන 3.62 ක්වූ ගෙවිය යුතු වෘත්තිය ගාස්තු ගිණුමේ දැක්වෙන ශේෂය නිරවුල් කිරීමට හෝ ආදායමක් ලෙස හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(උ) 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 20.45 ක්වූ ණයගැතියන්ගෙන් අයකර ගතයුතු මුදල් අයකර ගැනීමට නොහැකි බව හඳුනාගෙන තිබුණු නමුත් ඒ වෙනුවෙන් වන හානිකරණ අගය සඳහා ප්‍රතිපාදනයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිකර නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වත්කම්වල වටිනාකම රු.මිලියන 1.33 ක් ස්ථාවර වත්කම් ගිණුම්වලට නිවැරදිව හර කර තිබුණු නමුත් පරිත්‍යාග හා ප්‍රදාන ගිණුමට බැර කරනු වෙනුවට ණයහිමි ගිණුමට බැර කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(එ) 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු ණයගැති ගිණුමේ පැවති රු.මිලියන 22.88 ක්වූ බැර ශේෂ වලට හා වෙළඳ ණයහිමි ගිණුමේ පැවති රු.මිලියන 22.26 ක්වූ හර ශේෂවලට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කරනු වෙනුවට එම ගිණුම්වල ප්‍රතිවිරුද්ධ ශේෂවලට එරෙහිව හිලව්කර දක්වා තිබුණි. එසේම පෞද්ගලික අංශයේ බැංකුවක මහාරෝග්‍යශාලා මණ්ඩලය නමින් වූ ජංගම ගිණුමක 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 5.13 ක්වූ අයිරා ශේෂය, ජංගම වගකීමක් ලෙස හෙළිදරව් කරනු වෙනුවට ජංගම වත්කම්වලින් අඩුකර දක්වා තිබුණි.

(ඒ) මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන රු.මිලියන 12.50 ක්වූ Dialysis Assistant අරමුදලට අදාල ස්ථාවර තැන්පතුව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි.

(ඔ) 2018 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයෙන් මහාරෝග්‍යශාලා මණ්ඩලය වෙත ලැබී තිබුණු BMW වර්ගයේ මෝටර් රථය මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සභාපති නමින් ලියාපදිංචි කර තිබුණු නමුත් එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) 2016/2017 වර්ෂවලදී කඩා ඉවත්කර තිබුණු ගොඩනැගිලි 02ක පිරිවැය රු.මිලියන 3.63 ක් හා අදාල සමුච්චිත ක්ෂය පොත්වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. මෙම නිසා ගොඩනැගිලි පිරිවැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 2016 වර්ෂයේදී විකුණා තිබුණු නමුත් විකුණුම් වටිනාකම හඳුනාගත නොහැකි වූ හා 2017 හා 2018 වර්ෂවලදී අපහරණය කර රු.මිලියන 5.03 කට විකුණා තිබුණු උපකරණවල පිරිවැය හා සමුච්චිත ක්ෂයද හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ක) ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුමෙහි රු.මිලියන 38.55 ක් හා රු.මිලියන 8.29 ක් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.මිලියන 30.26 ක ශුද්ධ අගයක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ග) සේවයෙන් ඉවත්කර තිබුණු සේවකයෙකු විසින් රෝහලට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ පැවරූ නඩුවකට අදාළව මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් එම විනිශ්චය සභාවේ තැන්පත් කර තිබුණු මුදල රු.මිලියන 1.62 ක් විය. කම්කරු විනිශ්චය සභාව විසින් එම මුදල සමාලෝචිත වර්ෂය තුළදී අදාළ සේවකයා වෙත ගෙවා තිබුණු නමුත් එම ගෙවීම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා ජංගම වත්කම් ඊට සමාන අගයකින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ච) 2020 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ, ණයගැතියෝ හා රෝහල් ගාස්තු තැන්පතු යන විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ඉදිරිපත් කළ ලැයිස්තු, ලේඛන හා පරිගණක වාර්තා අනුව වටිනාකම අතර රු.මිලියන 63.4 ක වෙනසක් පැවති අතර වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි. එසේම නැවත ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ගිණුමට සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු රු.මිලියන 2.31 ක ගැලපීම් සම්බන්ධ විස්තරද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ජ) මුළු අගය රු.මිලියන 893.11 ක්වූ 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු ණයගැතියන්, එදිනට වෙළඳ ණයහිමියෝ, විවිධ තැන්පතු, සේවා ගාස්තු, ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු යනාදී වූ ගිණුම් විෂයයන් 05 ක් සම්බන්ධයෙන් අදාළ කාලවිශ්ලේෂණ, උපයෝගී ලේඛණ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය හෝ සන්නිරීක්ෂණය කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට හෝ නොහැකි විය.

(ට) මහාරෝග්‍යශාලා මණ්ඩලයේ ගිණුම්වලට අනුව, මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදී ගෙන තිබුණු ඖෂධ හා වෙනත් ශල්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු.මිලියන 472.52 ක් වුවද, වෛද්‍ය සැපයුම් අංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එදිනට එම ශේෂය රු.මිලියන 631.89 ක් විය. ඒ අනුව වූ රු.මිලියන 159.37 ක වෙනසට හේතු හඳුනාගෙන අදාල ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබා ගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව,මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.1.3 මෙම වාර්තාවේ 1.2 (ආ), (ඇ), (ඒ) හා (ඕ) ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරනලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති හා විධිවිධානවලට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>(i) II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ ඡේද | කාර්ය මණ්ඩලයේ සෑම සේවයකම හා සෑම ශ්‍රේණියකම තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) II පරිච්ඡේදයේ 5.2.6 උප ඡේදය | බඳවා ගැනීමේ තේරීම් මණ්ඩලය එහි සභාපතිද ඇතුළුව නිලධාරීන් 5 දෙනෙකුගෙන් සමන්විතව, එම මණ්ඩලයේ යටත් පිරිසෙන් එක් සාමාජිකයකු පුරප්පාඩු පවත්නා අමාත්‍යාංශය හෝ ආයතනයෙන් පරිබාහිර වූ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක නිලධාරියෙකුගෙන් සමන්විත විය යුතු වුවද, මහාරෝග්‍යශාලා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමේදී එම අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2014 ඔක්තෝබර් 11 දින රජයේ ගැසට් පත්‍රයේ සඳහන් ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය | වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කරමින් සිටි නිලධාරිනියක වෛද්‍ය නිලධාරී II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් වීමේදී වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව සපුරා තිබිය යුතු සුදුසුකම් සම්පූර්ණකර නොතිබියදී නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා 2017 පෙබරවාරි 01 දින සිට පත්කර තිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය. | මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත අනුමත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු වුවද, 2020 මූල්‍ය වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ගිණුම් මාස 08 කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2021 නොවැම්බර් 11 දින ඉදිරිපත් කර තිබුණි. |
| (ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 6.3.6 මාර්ගෝපදේශය | ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා ගත කළ යුතු අතර, එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කළ යුතු වුවද ඖෂධ මිලදී ගැනීමේදී එසේ කර නොතිබුණි. |
| (ii) 8.9.1 (ආ) | රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 5 කදී රු.මිලියන 24.19 කට මිලදී ගෙන තිබුණු ශල්‍ය උපකරණ සම්බන්ධයෙන් එවැනි කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කර නොතිබුණි. |
| (ඊ) 2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය | |
| (i) 2.1 මාර්ගෝපදේශය | ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය (NMRA Certificate) ලැබී ඇති වෛද්‍ය උපාංග පමණක් මිලදී ගත යුතු වුවද, එම සහතිකය ලබා ගෙන නොතිබුණු ශල්‍ය උපකරණ වර්ග 4ක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 4.78 ක් වැය කර තිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) 5.2 මාර්ගෝපදේශය | හදිසි මිලදී ගැනීම් හැර, තාක්ෂණික ඇගයීම් කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නියෝජිතයෙක්, අදාළ විශේෂඥතාව සහිත අවම උපදේශකවරුන් දෙදෙනෙක් හා භාණ්ඩාගාරයෙන් නම් කරන ලද නියෝජිතයෙකුගෙන් සමන්විත විය යුතු වුවද, ඖෂධ සා ශල්‍ය උපකරණ මිලදී ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව, රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙකු, අදාළ විශේෂඥතාව සහිත එක් උපදේශකයෙකු හා සහකාර ගණකාධිකාරිවරයෙකුගෙන් පමණක් සමන්විතව තිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | (i) සන්නිවේදන පහසුකම් සැපයීමේ උපරිම මාසික සීමාවන්ට යටත්ව, හිමිකම් ලබන නිලධාරීන්ගේ සියළුම කාර්යාලීය හා නිවාස දුරකථන හා ෆැක්ස්, පෞද්ගලික ජංගම දුරකථන හා අන්තර්ජාල පහසුකම් ඇතුළු බිල්පත් වටිනාකම ප්‍රතිපූර්ණය කළ යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි උපරිම මාසික සීමාවේ අගය දීමනාවක් ලෙස වැටුපට එකතු කර ගෙවා තිබුණි. ඒ අනුව 2020 වර්ෂය වෙනුවෙන් නිලධාරීන් 14 දෙනෙකු වෙත ගෙවා තිබුණු සන්නිවේදන පහසුකම් සැපයීමේ දීමනාවල එකතුව රු.707,000 ක් විය.<br>(ii) චක්‍රලේඛය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණු මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී මාසිකව රු.2,000 බැගින් රු.72,000 ක් සන්නිවේදන දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඈ) | 2016 ඔක්තෝබර් 10 දිනැති අංක.ඩීඑම්එස්/1758-Vol.1දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය. | අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඒ අනුව කටයුතුකර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ටෙන්ඩර් කොන්දේසිවලට අනුව නැවත මිල වැඩි කිරීම් සඳහා අනුමැතිය ලබාදිය නොහැකි වුවද, ඒ බව නොසලකා SUCOD 160 Disposable Examination Gloves (Small) Lalan ඒකක 570,000 ක් හා SUCOD 159 Disposable Examination Gloves (Medium) Lalan ඒකක 730,000 ක් එකක් රු. 6 ක් වැඩියෙන් එනම් රු.11 කට මිලටගැනීම නිසා රු.මිලියන 3.78 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) දත්ත ස්කෑන් කිරීමට, සමාජ මාධ්‍යගතකරණයට හා කාර්යමණ්ඩල දීමනා ආදිය සඳහා විද්‍යුත් ලිපිලේඛන කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පරිගණක මෘදුකාංගයක් මිලදී ගැනීමට අදාළව 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී රු.මිලියන 21.56 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් මෙම පරිගණක පද්ධතිය භාවිතකර නොතිබුණු හෙයින් මේ සඳහා දරන ලද පිරිවැය නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා අපේක්ෂිත විදේශ අරමුදල් ලබාගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව සයමහල් ගෙවන වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීමේ මූලික සැලසුම් කටයුතු සඳහා 2017 අප්‍රේල් 08 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත එකතු කළ අගය මත බදු සහිතව උපදේශන සේවා ගාස්තු ලෙසරු.මිලියන 5.76 ක් ගෙවා තිබුණි. නමුත් 2020 හා 2021 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැසුම් වලින් මෙම ව්‍යාපෘතිය ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මකවීම අවිනිශ්චිත බැවින් වැය කළ රු.මිලියන 5.76 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්විය හැකි බව නිරීක්ෂණය විය.

(ඈ) මහාරෝගාශාලා මණ්ඩලයේ සූර්ය බලශක්ති පද්ධති (Solar Energy Panels) ව්‍යාපෘතිය සඳහා උපදේශක ගාස්තු වශයෙන් රු.මිලියන 2.97 ක් 2018 වර්ෂයේදී මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට ගෙවා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් ගෙවිය යුතු මුදල රු.372,803 ක් විය. නමුත් 2020 හා 2021 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැසුම් වලින් මෙම ව්‍යාපෘතිය ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මකවීම අවිනිශ්චිත බැවින් වැය කළ රු.මිලියන 2.97 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්විය හැකි බව නිරීක්ෂණය විය.

## 2.3 වෙනත් කරුණු

(අ) මහාරෝගාශාලා මණ්ඩලය පිහිටි එම මණ්ඩලය සතු ඉඩමට අදාළ ඔප්පුව ප්‍රකාරව, සර්වෙයර් ජනරාල් (Surveyor General) විසින් 1981 දී හා 1983 දී සහතික කර තිබුණු පිඹුරුපත් 03 ක් යටතේ පවතින ඉඩම් කොටස්හි හෙක්ටයාර් 10.0229 ක මුළු භූමි ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය විය. ඉන් එක් පිඹුරුපතක ඇතුළත් හෙක්ටයාර් 9.9469ක භූමි ප්‍රමාණය සර්වෙයර් ජනරාල් වෙතින් 2015 වර්ෂයේදී නැවත මිනුම් කරවා ගෙන තිබුණි. එදින වන විට මණ්ඩලයේ පරිහරණය සඳහා පැවති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 9.8047ක් පමණක් බවත්, ස්ථාන 09 කට අදාළව හෙක්ටයාර් 0.1422 ක භූමි ප්‍රමාණයක් අනවසර පදිංචිකරුවන් විසින් පරිහරණය කරන බවත් සර්වෙයර් ජනරාල් විසින් හඳුනාගෙන වාර්තා කර තිබුණද ඒ සම්බන්ධයෙන් සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගැනීමට 2015 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්මික පුහුණු වැඩසටහන් ස්ථාපිත කිරීමේ අරමුණින් එවකට තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනාවක් අනුව මහාරෝගාශාලා මණ්ඩලය, තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ 2013 මැයි 09 දින එළඹි අවබෝධතා ගිවිසුමක් මත සෞඛ්‍ය වෛද්‍ය අධ්‍යයන විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ආරම්භ කර තිබුණි. 2016 මැයි වන විට ගිවිසුම අවසන්ව තිබුණද එතෙක් පාඨමාලා අවසන් නොකළ ශිෂ්‍යයන් වෙනුවෙන් විද්‍යායතනය පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු අතර සෞඛ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි විද්‍යායතනය වෙත රු.මිලියන 3.8 ක් දක්වා මූල්‍ය පහසුකම් සැපයීමටත්, එම මුදල එවකට සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණයකර ගැනීමටත් අපේක්ෂාකර තිබුණද, 2016 වර්ෂයේ සිට 2019 වර්ෂයේ අවසානය දක්වා රෝහල විසින් වැයකර තිබුණු රු.මිලියන 8.94 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) විශේෂඥ වෛද්‍යවරුන් සිය රාජකාරී වේලාවෙන් පසු සිදුකරනු ලබන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා මහාරෝගාශාලා මණ්ඩලය විසින් මාසිකව රු.581,418 ක් පමණ පොදුකාර්ය පිරිවැය ලෙස වැය කරන බව හඳුනාගෙන තිබුණි. නමුත් එම ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා අය කරනු ලබන වෘත්තීය ගාස්තුවලින් සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකිරීමේ ක්‍රමවේදය මත සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු.මිලියන 363.17 කින් අයකර තිබුණු මුළු සේවා ගාස්තුව රු.546,035 ක් පමණක් විය. සේවා ගාස්තුව වැඩි කිරීම සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 25 දින අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා ඉදිරිපත්කර තිබුණද සත්‍ය වශයෙන් වැයකරන පිරිවැයට සාපේක්ෂව අය කරන සේවා ගාස්තුව වැඩිකර ගැනීමට මෙතෙක් අපොහොසත්වී තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඈ) මහාරෝග්‍යශාලා මණ්ඩලයේ පවතින තොග සම්බන්ධ පරිගණක පද්ධතියේ තොරතුරු ගිණුම්කරණ පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවත ගිණුම්කරණ පද්ධතිය තුළ යාවත්කාලීන නොකළ අවස්ථා නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. මේ හේතුවෙන් ගිණුම්කරණ පරිගණක පද්ධතිය තුළ පවතින ගැනුම් පිරිවැය, ණයහිමියෝ, ණයගැතියෝ සහ රෝහල් ගාස්තු ආදායම යන අයිතමයන්ගේ සත්‍ය අගයන් මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය වන්නේද යන්න පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. රෝහලේ පවතින පරිගණක පද්ධති යාවත්කාලීන නොකිරීම, පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (System link) ඇතිකර නොතිබීම හා පරිගණක පද්ධතියේ දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීම මීට හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය. එසේම මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමෙන් පසුව පද්ධතියේ ඇතුළත් වාර්තා වෙනස් කිරීමට ඇති පහසුකම අහුරා තැබිය යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

(ඉ) මහාරෝග්‍යශාලා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ වෛද්‍ය නිලධාරිනියකට 2018 මැයි 30 දින සිට 2019 ජූලි 11 දක්වා වූ කාලය තුළදී වැටුප් රහිත විදේශගත පුහුණුවක් සඳහා එක්සත් රාජධානියේ Oxford විශ්ව විද්‍යාලයට යාමට ශිෂ්‍යත්වයක් ලැබී තිබුණි. වෛද්‍ය නිලධාරිනියගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් ගෙවීමට අදාළ නීත්‍යානුකූල භාවය පිළිබඳ කරුණු විමසීමෙන් තොරව හා නිලධාරිනිය විසින් ඉදිරිපත් කරන ලද විදේශ ශිෂ්‍යත්ව අයදුම්පත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේපකර තිබියදී එම නිලධාරිනියට ශිෂ්‍යත්වය සඳහා විදේශගත වීමට වර්ෂ 2 ක් දක්වා වැටුප් සහිත නිවාඩු හා පෞද්ගලික වියදම් දීමනාවක් (Personal Maintenance Allowances) ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. මේ හේතුවෙන් පෞද්ගලික වියදම් දීමනාව ලෙස ගෙවා තිබුණු රු.මිලියන 5.80 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගත නොහැකිවී තිබුණු අතර එම මුදල හා වේතන ලෙස ගෙවූ රු.මිලියන 3.79 ක් රෝහලට වැය බරක්වී තිබුණි.

(ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා තනතුරු 03ක් සඳහා නිලධාරීන් 251 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු 05ක් සඳහා නිලධාරීන් 10 දෙනෙකු පත්කර තිබුණි.

(උ) වර්ෂ 4 සිට වර්ෂ 23 ක කාලයක සිට පැවත එන එකතුව රු.මිලියන 5.73 ක්වූ ගෙවිය යුතු ශේෂ 16 ක් නිරවුල් කිරීමට හෝ වගකීමක් නොමැති ශේෂ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

**ශ්‍රී ජයවර්ධනපුර මහරෝහශාලා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණ සහ නිවැරදි කර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග**

| විගණන නිරීක්ෂණ | | | නිවැරදි කර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| **1.2** | තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම | | |
| | (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය, ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදු වූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්ධනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු. මිලියන 10.26 ක් 2020 ජනවාරි 01 දින ඉදිරියට ගෙන ආ සමුච්චිත ඌනතාවයට හා රු. මිලියන 2.8 ක් අනෙකුත් සංචිත ශේෂයට ගලපා තිබුණි. මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමක්ද සිදුකර නොතිබුණි. | මෙම කරුණ සමග එකඟ වන අතර මෙවැනි තත්වයන් 2021 වර්ෂයේදී සිදු නොවීමට උපදෙස් ලබා දී ඇත. |
| | (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු. මිලියන 2,901.52 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවත් මෙකී වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර එම වත්කම්වල ඵලදායි ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණ ක්ෂය වීම අවසන් කර ඇති ස්ථාවර වත්කම් තවමත් භාවිතයේ පවතින අතර මෙම සියලුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර එය මෙම වර්ෂයේදී අවසන් කිරීමට කටයුතු කරනු ඇත. ඒ අනුව විගණන විමසුමේ මතු කර ඇති කරුණ නිරාකරණය වනු ඇත. |
| | (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39 (අ) ඡේදය ප්‍රකාරව, සේවා සැපයීමට අදාළ ගනුදෙනුවල අයභාර හඳුනා ගැනීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 2,353.15 ක්වූ රෝහල් ගාස්තු (Hospital Charges ) ගණනය කිරීම සඳහා අනුගමනය කරන ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව අයභාර ප්‍රමාණය විශ්වසනීය මැනිය හැකි වීම මත හා ගනුදෙනුව හා ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්වයට (රෝහලට) නිෂ්කාශනය වීම මත අයභාර හඳුනාගැනීම සිදුවේ.<br>එසේම අයභාර ප්‍රමාණය ඉතාමත් සාධාරණ ලෙස හඳුනා ගැනීමට මිල සමීකරණයක් හඳුන්වා දීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | **Price Formula for Tests**<br>$P = E_1 + E_2 + E_3 + E_4 + E_5 /5$<br>Indicators<br>P = Price charged from patients for tests<br>$E_1$ = Consumables Billed<br>$E_2$ = Personnel Emoluments<br>$E_3$ = Overheads [Consumption, Utility payments (interest cost-interest income) other operating expenses,]<br>$E_4$ = Fuel (Diesel, Furnace oil, Petrol, K.oil,)<br>$E_5$ = [Total Revenue – (Total Expenditure-Recurrent grant) ]<br>=Profit/Loss |
| | (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී ඇඳ ඉහපත් අංක 15 කට අදාළ ණයගැති හා නිදහස් රෝහල් වියදම් වටිනාකම නැවත නැවත රෝහල් පාලන ගිණුමට බැරකර තිබීම හේතුවෙන් රෝහල් ගාස්තු ආදායම රු. මිලියන 13.81 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු බව නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. | පරිගණක පද්ධතිය පරීක්ෂා කර බලා මෙහි සඳහන්ව ඇති වටිනාකම හා ඊට අමතරව විගණන විමසුමේ පෙන්වා දී ඇති ගිණුම්කරණ දෝෂය 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| | (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු පාලන ගිණුමේ පැවති රු. මිලියන 4.23 ක හර ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු නොකර ඒ වෙනුවට එම ශේෂය රෝහල් නේවාසික ගාස්තු ආදායම් ගිණුමට මාරුකර තිබුණි. ඒ හේතුවෙන් රෝහල් නේවාසික ගාස්තු ආදායම ඊට සමාන අගයකින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | රෝහල් ගාස්තු පාලන ගිණුම, 2021.12.31 දිනට විශ්ලේෂණය කර වෙනසක් තිබේනම් අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. ඒ අනුව විගණන විමසුමෙන් පෙන්වා දී ඇති කරුණු ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කර ඇත. |
| | (ඊ) | වෘත්තිය ගාස්තු අයකිරීම් හා ආපසු ගෙවීම් නිසි පරිදි ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට වෘත්තිය ගාස්තු ගිණුමේ පැවති රු. මිලියන 62.64 ක හර ශේෂයට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කරන වෙනුවට එම ශේෂය රෝහල් ගාස්තු පාලන ගිණුමට මාරුකර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 1998 වර්ෂයේ සිට පැවතෙන රු. මිලියන 3.62 ක්වූ ගෙවිය යුතු වෘත්තිය ගාස්තු ගිණුමේ දැක්වෙන ශේෂය නිරවුල් කිරීමට හෝ ආදායමක් ලෙස හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමේ සඳහන් කරුණු සමග එකඟ වන අතර වෘත්තිය ගාස්තු නිවැරදිව ගිණුම් තුල ගිණුම් ගත වීමට අදාල කටයුතු මේ වනවිට සිදු වෙමින් පවතී. |
| | (උ) | 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 20.45 ක්වූ ණයගැතියන්ගෙන් අයකර ගතයුතු මුදල් අයකර ගැනීමට නොහැකි බව හඳුනාගෙන තිබුණු නමුත් ඒ වෙනුවෙන් වන | 2021 වර්ෂයේ සිට ණයගැතියන්ගෙන් අඩමාන ණය වෙන් කිරීමක් සිදු කිරීමට කටයුතු කරන අතර එය මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරවු කිරීමට කටයුතු කෙරෙනු ඇත. |

| | | | |
|---|---|---|---|
| | | හානිකරණ අගය සඳහා ප්‍රතිපාදනයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිකර නොතිබුණි. | එසේම මෙය 2021 දී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. එසේම කොවිඩ් වසංගතය නිසා වෙනත් රෝහල් වෙත මාරු කර ඇති රෝගීන්ගෙන් මුදල් අය කර ගැනීම මේ වනවිටත් සිදු වෙමින් පවතී. |
| | (ඌ) | ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේ දී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වත්කම්වල වටිනාකම රු. මිලියන 1.33 ක් ස්ථාවර වත්කම් ගිණුම්වලට නිවැරදිව හර තිබුණු නමුත් පරිත්‍යාග හා ප්‍රදාන ගිණුමට බැර කරනු වෙනුවට ණයහිමි ගිණුමට බැර කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්රදාන වටිනාකම ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | පරිත්‍යාග වශයෙන් ලැබී තිබු වත්කම් ණයහිමි ගිණුමට බැර කර තිබීම 2021 වර්ෂයේදී නිවැරදි කරමි. |
| | (එ) | 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු ණයගැති ගිණුමේ පැවති රු. මිලියන 22.88 ක්වූ බැර ශේෂවලට හා වෙළඳ ණයහිමි ගිණුමේ පැවති රු. මිලියන 22.26 ක්වූ හර ශේෂවලට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපිම් සිදු කරනු වෙනුවට එම ගිණුම්වල ප්‍රතිවිරුද්ධ ශේෂවලට එරෙහිව හිලව්කර දක්වා තිබුණි. එසේම පෞද්ගලික අංශයේ බැංකුවක මහාරෝග්‍යශාලා මණ්ඩලය නමින් වූ ජංගම ගිණුමක 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 5.13 ක්වූ අයිරා ශේෂය, ජංගම වගකීමක් ලෙස හෙළිදරව් කරනු වෙනුවට ජංගම වත්කම්වලින් අඩුකර දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී ණයගැති සහ ණයහිමි ගිණුම් වල සැසඳුම් කටයුතු සිදුකරමින් පවතින අතර 2021 ගිණුම් ඉදිරිපත් කිරීමේදී එම තත්වය නිවැරදි කරනු ඇත. |
| | (ඒ) | මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන රු. මිලියන 12.50 ක්වූ Dialysis Assistant අරමුදලට අදාල ස්ථාවර තැන්පතුව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. | Dialysis Assistant අරමුදලට අදාල ස්ථාවර තැන්පතුව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල නිවැරදිව පෙන්වා ඇත. |
| | (ඔ) | 2018 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයෙන් මහාරෝග්‍යශාලා මණ්ඩලය වෙත ලැබී තිබුණු BMW වර්ගයේ මෝටර් රථය මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සභාපති නමින් ලියාපදිංචි කර තිබුණු නමුත් එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ එම මෝටර් රථයේ ප්‍රත්‍යාගණන වටිනාකම ගිණුම් වල සටහන් කර ඇත. |
| | (ඕ) | 2016/2017 වර්ෂවලදී කඩා ඉවත්කර තිබුණු ගොඩනැගිලි 02 ක පිරිවැය රු. මිලියන 3.63 ක් හා අදාල සමුච්චිත ක්ෂය පොත්වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. මෙම නිසා ගොඩනැගිලි පිරිවැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූලය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 2016 වර්ෂයේදී විකුණා තිබුණු නමුත් විකුණුම් | 2021 වර්ෂයේ ගිණුම්වල මෙම ගිණුම්කරණ මග හැරීම නිවැරදි කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | වටිනාකම හඳුනාගත නොහැකි වූ හා 2017 හා 2018 වර්ෂවලදී අපහරණය කර රු. මිලියන 5.03 කට විකුණා තිබුණු උපකරණවල පිරිවැය හා සමුච්චිත ක්ෂයද හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | |
| | (ක) | ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුමෙහි රු. මිලියන 38.55 ක් හා රු. මිලියන 8.29 ක් පිළිවෙලින් වැඩියෙන් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු. මිලියන 30.26 ක ශුද්ධ අගයක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2020.12.31 දින වන විට වැඩ සම්පූර්ණ කිරීමේ සහතික නිකුත් කර නොමැති බැවින් එම අගයන් වත්කම් ගිණුම් වලට මාරු කර නොමැත. වැඩ සම්පූර්ණ කිරීමේ සහතිකය නිකුත් කරන තෙක් එය වත්කම් වශයෙන් තහවුරු නොවේ. වැඩ සම්පූර්ණ කිරීමේ සහතිකය ලද පසු 2021 වර්ෂයේදී මෙය වත්කම් ගිණුමට මාරු කරනු ඇත. |
| | (ග) | සේවයෙන් ඉවත්කර තිබුණු සේවකයකු විසින් රෝහලට එරෙහිව කම්කරු විනිශ්වය සභාවේ පැවරූ නඩුවකට අදාළව මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් එම විනිශ්වය සභාවේ තැන්පත් කර තිබුණු මුදල රු. මිලියන 1.62 ක් විය. කම්කරු විනිශ්වය සභාව විසින් එම මුදල සමාලෝචිත වර්ෂය තුළදී අදාළ සේවකයා වෙත ගෙවා තිබුණු නමුත් එම ගෙවීම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා ජංගම වත්කම් ඊට සමාන අගයකින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | විගණන විමසුමේ පෙන්වා දී ඇති ගිණුම්කරණ දෝෂය 2021 දී නිවැරදි කර ඇත. |
| | (ඝ) | 2020 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ, ණයගැතියෝ හා රෝහල් ගාස්තු තැන්පත් යන විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ඉදිරිපත් කළ ලැයිස්තු, ලේඛණ හා පරිගණක වාර්තා අනුව වටිනාකම අතර රු. මිලියන 63.4 ක වෙනසක් පැවති අතර වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි. එසේම නැවත ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ගිණුමට සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු රු. මිලියන 2.31 ක ගැලපීම සම්බන්ධ විස්තර ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණන විමසුමේ පෙන්වා දී ඇති ලිපිගොනු, ලේඛන හා ලේජරයේ ශේෂයන් අතර වෙනසට අදාල ගිණුම් සැසඳීම 2021 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර ඒ අනුව මෙම ගිණුම්වල කේවල ශේෂ හා ප්‍රධාන ලේජර අතර වෙනස නිවැරදි වනු ඇත. |
| | (ජ) | මුළු අගය රු. මිලියන 893.11 ක්වූ 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු, ණයගැතියන්, එදිනට වෙළඳ ණයහිමියෝ විවිධ තැන්පතු,සේවා ගාස්තු ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු යනාදී වූ ගිණුම් විෂයයන් 05 ක් සම්බන්ධයෙන් අදාළ කාලවිශ්ලේෂණ, උපයෝගී ලේඛණ හා | වර්ෂ 36 කට වඩා පැරණි විවිධ තැන්පතු සඳහා සාක්ෂි ඉදිරිපත් නොවූ බව සඳහන් කර ඇත. විවිධ තැන්පතු සෑදී ඇත්තේ විදුලි බල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, සිලෝන් ගෑස් සමාගම, ටෙලිකොම් සමාගම වැනි ආයතන වලින් සම්බන්ධතා / සේවා ලබා ගැනීමේදී තැන්පත් කර ඇති |

| | | | |
|---|---|---|---|
| | | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය හෝ සන්නිරීක්ෂණය කිරීමට හෝ විගණනයේ දී පිළිගැනීමට හෝ නොහැකිවිය. | තැන්පතු වලිනි.<br>මෙම බොහෝ තැන්පතු 1984- 1985 කාලවකවානුවට අදාල වන අතර එම අවධියේදී එම තැන්පතු සඳහා නිකුත් කර ඇති රිසිට්පත් අදාල වවුචරය සමග අමුණා ඇත. මෙම පැරණි වවුචර පත් දැනට විනාශ කර ඇති අතර විගණනයේදී මෙම සම්බන්ධතා භෞතිකව නිරීක්ෂණය කල හැකි බැවින් මෙම විගණන විමසුම ප්‍රයෝගිකත්වයෙන් බැහැර වී ඇත. මෙසේ තැන්පත් මුදල් ගෙවා නොමැති නම් අදාල සම්බන්ධතා නොලැබෙනු ඇත. එබැවින් මෙම විගණන විමසුම ඉවත් කර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.<br>අනෙකුත් සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති අංක ii සිට v දක්වා කරුණු සම්බන්ධයෙන් 2021 වර්ෂයේදී විගණනයට අදාල සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙනු ඇත. |
| | (ට) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ ගිණුම්වලට අනුව, මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදී ගෙන තිබුණු ඖෂධ හා වෙනත් ශල්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු. මිලියන 472.52 ක් වුවද වෛද්‍ය සැපයුම් අංශය විසින් විගණනට ඉදිරිපත් කළ තොරතුරු අනුව එදිනට එම ශේෂය රු. මිලියන 631.89 ක් විය. ඒ අනුව වූ රු. මිලියන 159.37 ක වෙනසට හේතු හඳුනාගෙන අදාල ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමෙන් පෙන්වා දී ඇති 2010 සිට 2015 වර්ෂය දක්වා වෛද්‍ය සැපයුම් අංශයෙන් මිලදී ගෙන ඇති ඖෂධ හා වෙනත් ශල්‍ය ද්‍රව්‍ය සඳහා ගෙවීමට ඇති මුදල, සෞඛ්‍ය අමාත්‍යංශයෙන් එවා ඇති හෘද රෝගීන් සඳහා සිදු කර ඇති සැත්කම් වෙනුවෙන් ලැබිය යුතු මුදල්, විධිමත් අනුමැතිය යටතේ හිලවු කිරීම් ගිණුම් තුල සිදු කර ඇත. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් 2014.09.19 පවති රැස්වීමේදී ලිඛිත අනුමැතිය හිමිවී ඇත.<br>ශ්‍රී ජයවර්ධපුර රෝහල විසින් වෛද්‍ය සැපයුම් අංශයෙන් ලබාගන්නා ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය පරිගණක පද්ධතියට ඇතුලත් කිරීමෙන් පමණක් ගබඩා වෙත භාර ගනු ලැබේ. මෙසේ වෛද්‍ය සැපයුම් අංශයෙන් ලබා ගන්නා වකුගඩු රෝගීන් සඳහා පමණක් නිකුත් කරන ඖෂධ මුදල් අය කිරීමකින් තොරව රෝහල වෙත ලබා දීමට අනුමැතිය හිමිවී ඇත.<br>එම ඖෂධ වටිනාකම සඳහන් නොකර පරිගණක පද්ධතියට ඇතුලත් කරන අතර අපගේ පරිගණක පද්ධතියේ ඖෂධ වටිනාකම නිවැරදිව සටහන් වන බැවින් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් එම අගය නිවැරදි වනු ඇත. වෛද්‍ය සැපයුම් අංශයෙන් අන්තරායකර ඖෂධ මිලදී ගැනීමේදී ඒ සඳහා අදාල ගෙවීම් |

| | | |
|---|---|---|
| | | සිදුකිරීමෙන් පසුව පමණක් එම ඖෂධ ලබාදීම සිදු කරනු ලැබේ.<br>එමනිසා වෛද්‍ය සැපයීම් අංශයේ ඇති වටිනාකම අපගේ මූල්‍ය ප්‍රකාශනවල ඇති වටිනාකම සමග ගැලපීම උචිත නොවේ. |
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණනයේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. | |
| 1.3 | **මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු** | |
| | මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.<br>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.<br><br>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබා ගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.<br><br>මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත. | |

| | | |
|---|---|---|
| 1.4 | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්** | |
| | මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.<br>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.<br><br>මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.<br><br>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. | |
| 1.5 | **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම** | |
| | සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික | |

තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුයෙන් සිදුවන ප්‍රණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ

| | | | |
|---|---|---|---|
| | | අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.<br><br>• මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.<br><br>මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි. | |
| 2. | | **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** | |
| | 2.1 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ. | |
| | 2.1.1 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි. | |
| | 2.1.2 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) ඇ (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ. | |
| | 2.1.3 | මෙම වාර්තාවේ 1.2(ආ), (ඇ), (ඒ) හා (ඕ) ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත. | |

| | | | |
|---|---|---|---|
| | 2.2 | අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය. | |
| | 2.2.1 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව. | |
| | 2.2.2 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව. | |
| | **නීති රීති හා විධිවිධානවලට යොමුව හා විස්තරය** | | |
| | (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| | (i) | <u>II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ ඡේද</u><br>කාර්ය මණ්ඩලයේ සෑම සේවයකම හා සෑම ශ්‍රේණියකම තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටියේ පළමු කෙටුම්පත මහාචාර්ය එම්. තිලකසිරි මහතා විසින් ශ්‍රී ජයවර්ධනපුර රෝහල වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව එය කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරීන් වෙත ලබා දුන් අතර එහිදී මතුවූ ගැටලු නිරාකරණය කරගැනීම උදෙසා සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී. මීට අමතරව කාර්ය මණ්ඩලයෙන් ලැබුණු ලිඛිත යෝජනාද උපදේශක තුමා වෙත යොමු කිරීමෙන් අනතුරුව අවසාන කෙටුම්පත අප වෙත ඉදිරිපත් කර ඇත. එය නැවත වරක් ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීමෙන් පසු අප විසින් රජයේ අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට නියමිතය. |
| | (ii) | <u>II පරිච්ඡේදයේ 5.2.6 උප ඡේදය</u><br>බඳවා ගැනීමේ තේරීම් මණ්ඩලය එහි සභාපතිද ඇතුළුව නිලධාරීන් 5 දෙනෙකුගෙන් සමන්විතව, එම මණ්ඩලයේ යටත් පිරිසෙන් එක් සාමාජිකයකු පුරප්පාඩු පවත්නා අමාත්‍යාංශ හෝ ආයතනයෙන් පරිබාහිර වූ අමාත්‍යාංශක හෝ | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් ලෙස සහභාගී වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුවක නිලධාරියෙකුගෙන් සමන්විත විය යුතු වුවද, මහාරෝගාශාලා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමේදී එම අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොතිබුණි. | |
| | (ආ) | <u>2014 ඔක්තෝබර් 11 දින රජයේ ගැසට් පත්‍රයේ සඳහන් ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය</u><br>වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කරමින් සිටි නිලධාරිනියක වෛද්‍ය නිලධාරී II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් වීමේදී වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව සපුරා තිබිය යුතු සුදුසුකම් සම්පූර්ණ කර නොතිබියදී නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා 2017 පෙබරවාරි 01 දින සිට පත්කර තිබුණි. | රෝහලේ කාර්යයන් අඛණ්ඩව කරගෙන යාම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරයේ රාජකාරි කටයුතු ඉතා වැදගත් වේ. මෙවැනි තත්වයන් මත ආයතනයේ පරිපාලනමය අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන 1983 අංක 54 දරණ විශේෂ පාර්ලිමේන්තු පනතේ 07 වන වගන්තියේ බලය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන තෙක් අභ්‍යන්තරයේ සිටි වඩාත්ම සුදුසු නිලධාරියෙකු එම තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය, පනතින් ලබාදී ඇති බලතල අනුව මෙම තීරණය ලබාගත් අතර එය ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 13:5 මගින් ද ප්‍රතිපාදන සලසා ඇත. |
| | (ඇ) | <u>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය</u><br>චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම දැනට ආරම්භ කර ඇති අතර මෙම ලේඛනය 2021 වර්ෂයේ මූල්‍ය ගිණුම් සමග විගණනයට ඉදිරිපත් කිරීමට උපරිම උත්සාහ ගනිමි. |
| | (ඈ) | <u>2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය</u><br>මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත අනුමත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු වුවද, 2020 මූල්‍ය වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ගිණුම් මාස 08 කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2021 නොවැම්බර් 11 දින ඉදිරිපත් කර තිබුණි. | මෙම විගණන විමසුම සමග එකග වෙමි. 2021 වර්ෂයේදී නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරමි. |
| | (ඉ) | <u>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය</u> | |
| | (i) | <u>6.3.6 මාර්ගෝපදේශය</u><br>ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කළ යුතු අතර, එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කළ යුතු වුවද ඖෂධ මිලදී ගැනීමේදී එසේ කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 අනුව ලංසු විවෘතය සඳහා සහභාගී වන නියෝජිතයන්ගේ පැමිණීම සටහන් කර අත්සන් ලබා ගන්නා ලේඛනයක් සෑම ලංසු විවෘතයකදීම ලබා ගන්නා අතර එය වෙනම ගොනුවක ගොනුගත කර පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව එම ලේඛනය අදාල ගොනුව තුල ගොනු ගත කර |

| | | | |
|---|---|---|---|
| | | | නොමැති බව පිළිගන්නා අතර එම ලේඛන වෙනම ගොනුවක පවත්වාගෙන යනු ලැබේ. |
| | (ii) | 8.9.1 (ආ)<br>රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 5 කදී රු. මිලියන 24.19 කට මිලදී ගෙන තිබුණු ශල්‍ය උපකරණ සම්බන්ධයෙන් එවැනි කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) වගන්තිය පරිදි ශ්‍රී ලංකා රුපියල් 500,000.00 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කල යුතු වුවත් එම ගිවිසුම අත්සන් කර ලබා නොගැනීම අපගෙන් සිදුවූ අඩුපාඩුවක් බව පිළිගනිමි. මෙම අතපසුවීම එම වර්ෂයේ රට තුල පැවති කොවිඩ් 19 වසංගතය මත සිදු වී ඇති අතර එම කාලය තුල සමහර ආයතන වසා තැබීම හා online ක්‍රමය මත භාණ්ඩ සැපයීම සිදු කිරීම මෙයට බලපාන ලදී. කෙසේ වෙතත් මෙවැනි සිදුවීම් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| | (ඊ) | 2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය | |
| | (i) | 2.1 මාර්ගෝපදේශය<br>ජාතික ඖෂධ නියාමන ධිකාරියේ ලියාපදිංචි සහතිකය (NMRA Certificate) ලැබී ඇති වෛද්‍ය උපාංග පමණක් මිලදී ගත යුතු වුවද, එම සහතිකය ලබාගෙන නොතිබුණු ශල්‍ය උපකරණ වර්ග 4 ක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 4.78 ක් වැය කර තිබුණි. | ඖෂධ හා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1 වගන්තිය පරිදි වෛද්‍ය උපාංග මිලදී ගැනීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය තිබිය යුතුය. මෙම අයිතමයන් භාවිතා කරනුයේ රෝහලේ කරනු ලබන හෘද සැත්කම් සඳහාය. තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත NMRA සහතිකය ලබා ගැනීමට යටත්ව මිලදී ගැනීම අනුමත කර තිබුණි. නමුත් එම සහතිකය ලබා නොදීම මත මිලදී ගැනීම කල නොහැකි විය. නමුත් හෘද සැත්කම් සඳහා අත්‍යාවශ්‍ය මෙම අයිතම ලබා දෙන ලෙස අදාල අංශයෙන් ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව හදිසි අවශ්‍යතාව සලකා අයිතම කිහිපයක් මිලදී ගැනීමට රෝහල් සභාපති අනුමැතිය ලබා දී ඇත. නමුත් නැවත නැවත එම අවශ්‍යතාවයන් පිළිබඳ හෘද ඒකකය කල ඉල්ලීම මත නැවත ප්‍රසම්පාදන කමිටුව මෙය සලකා බලා NMRA ආයතනයෙන් Waiver of registration අනුමැතියකට යටත්ව මිලදී මිලදී ගැනීමට අනුමැතිය ලබා දී ඇත. නමුත් එයද ලබා දී නොමැත. මෙම තත්වය මත අවශ්‍යතාව පරිදි එම |

| | | | |
|---|---|---|---|
| | | | අයිතම මිලදී ගැනීමට සිදු කර ඇති අතර එය රෝහල් සභාපති අනුමැතිය යටතේ මිලදී ගෙන ඇත.<br><br>මේ සඳහා වන විකල්ප නොමැති වීම මත මෙම මිලදී ගැනීම සිදුකර ඇති අතර ජාතික රෝහලෙන්ද විමසීම් කරන ලදුව ඔවුන්ද මේ අයුරින් මෙම ආයතනයෙන් මිලදී ගන්නා බව ප්‍රකාශ කර තිබේ. රෝහල් සේවාව අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා එම අයිතමයන් රෝහල් සභාපති වශයෙන් මාගේ අනුමැතිය මත ලබා ගන්නා ලදී. (මෙම අයිතමයන් මෙරටට ගෙන්වන එකම ආයතනය වන්නේ Meditek Devices (Pvt) Ltd. ආයතනයයි.) |
| | (ii) | <u>5.2 මාර්ගෝපදේශය</u><br>හදිසි මිලදී ගැනීම් හැර, තාක්ෂණික ඇගයීම් කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නියෝජිතයෙක්,අදාළ විශේෂඥතාව සහිත අවම උපදේශකවරුන් දෙදෙනෙක් හා භාණ්ඩාගාරයෙන් නම් කරන ලද නියෝජිතයෙකුගෙන් සමන්විත විය යුතු වුවද, ඖෂධ සහ ශල්‍ය උපකරණ මිලදී ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව, රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, අදාළ විශේෂඥතාව සහිත එක් උපදේශකයෙකු හා සහකාර ගණකාධිකාරිවරයෙකුගෙන් පමණක් සමන්විතව තිබුණි. | ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා වෙනම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් නිකුත්කර ඇත. එම මාර්ගෝපදේශයට අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන්ගේ සංයුතිය දක්වා තිබේ. නමුත් මෙම සංයුතියට අනුව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් පත් කර ගැනීම හා ක්‍රියාත්මක කර ගැනීම ප්‍රායෝගිකව ඉතාම අපහසු කාර්යක් වේ. මේ සම්බන්ධයෙන් අනෙකුත් රෝහල් වලින් (ජාතික රෝහල, දකුණු කොළඹ රෝහල) විමසා බැලීම කරන ලදි. එහිදීද දැනගත හැකි වූයේ මෙම සංයුතියට අනුව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර ක්‍රියාත්මක කිරීම ඉතා අසීරු බවත්, ඔවුන් එම ආයතනයට අදාල ටෙන්ඩර් මණ්ඩලයට අනුව ඇගයීම් කමිටු පත් කර ක්‍රියාත්මක කරන බවයි.<br>ඒ අනුව මෙම රෝහලද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු මට්ටමෙන් තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර ක්‍රියාත්මක කරනු ලැබේ. තවද මේ සඳහා වන ප්‍රසම්පාදන කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ සමාජිකයන්ගෙන් සමන්විත වේ. |
| | (උ) | <u>2015 මැයි 25 දිනැති අංක පීඩ් 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය</u> | |
| | (i) | සන්නිවේදන පහසුකම් සැපයීමේ උපරිම මාසික සීමාවන්ට යටත්ව, හිමිකම් ලබන නිලධාරීන්ගේ සියළුම කාර්යාලීය හා නිවාස දුරකථන හා ෆැක්ස්, පෞද්ගලික ජංගම දුරකථන හා අන්තර්ජාල පහසුකම් ඇතුළු | විගණන විමසුමේ සඳහන් කරුණු පිළිගන්නා අතර i. 2022 ජනවාරි මස සිට 2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව ගෙවීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | බිල්පත් වටිනාකම ප්‍රතිපූර්ණය කළ යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි උපරිම මාසික සීමාවේ අගය දීමනාවක් ලෙස වැටුපට එකතුකර ගෙවා තිබුණි. ඒ අනුව 2020 වර්ෂය වෙනුවෙන් නිලධාරීන් 14 දෙනෙකු වෙත ගෙවා තිබුණු සන්නිවේදන පහසුකම් සැපයීමේ දීමනාවල එකතුව රු.707,000 ක් විය. | |
| | (ii) | වක්‍ර ලේඛය මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණු මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී මාසිකව රු.2,000 බැගින් රු.72,000 ක් සන්නිවේදන දීමනා ලෙස ගෙවා තිබුණි. | |
| | (ආ) | <u>2016 ඔක්තෝබර් 10 දිනැති අංක ඩීඑම්එස්/1758-Vol 1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය.</u><br>අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඒ අනුව කටයුතුකර නොතිබුණි. | මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය යෝජනා සැකසීම අවසන් අදියරේ පවතින අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකොට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ඇත. |
| | 2.2.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව. | |
| | 2.2.4 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව. | |
| | (අ) | ටෙන්ඩර් කොන්දේසිවලට අනුව නැවත මිල වැඩි කිරීම සඳහා අනුමැතිය ලබාදිය නොහැකි වුවද, ඒ බව නොසලකා SUCOD 160 Disposable Examination Gloves (Small) Lalan ඒකක 570,000 ක් හා SUCOD 159 Disposable Examination Gloves (Medium) Lalan ඒකක 730,000 ක් රු. 6 ක් වැඩියෙන් | මෙම ප්‍රකාශය සමඟ සංශෝධනයන්ට යටත්ව එකඟ වේ.<br>මෙම ඇණවුම 2020 වර්ෂය සඳහා ලබා දී තිබේ. මෙම සැපයුම්කරු අදාල මිල කැඳවීමේදී අවම මිල ලබා දී ඇති සැපයුම්කරු වේ. සැපයුම්කරු අදාල මිලට භාණ්ඩ සැපයීම් කරන අතර තුර අමුද්‍රව්‍ය වල මිල ඉහල යාම එම මිල වැඩි කරන |

| | | | |
|---|---|---|---|
| | | එනම් රු. 11 කට මිලට ගැනීම නිසා රු. මිලියන 3.78 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ලෙස ඉල්ලා ඇත්තේ 30.10.2020 දිනැති ලිපියකින් නොව 27.11.2020 සහ 30.11.2020 දිනැති ලිපි මඟිනි. තවද එය ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර තීරණය ලබා ගෙන ඇත්තේ 02.09.2020 දින නොව 02.12.2020 දින දීය.<br>මෙම වකවානුව තුල COVID -19 වසංගතය දරුණු ලෙස පැතිරුණ කාලයකි. මෙම කාලය තුල COVID රෝගීන්ගේ වැඩි වීම මත රෝහල් කාර්ය මණ්ඩලයේ සහ රෝගීන්ගේ ආරක්ෂාව දැඩිව තහවුරු කල යුතු විය. එයිදී Disposable Examination Gloves සඳහා වූ අවශ්‍යතාවය කිපගුණයකින් ඉහල ගිය අතර රෝගී සේවාව පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍යක් විය. මේ වන විට ලංකාව තුල සිටි එකම සැපයුම්කාර ආයතනය මෙම ආයතනය විය. තවද මෙම සැපයුම්කරු රජයේ වෛද්‍ය සැපයුම් අංශයේද සැපයුම්කරු විය.<br><br>මෙවැනි තත්වයක් මත සැපයුම්කරුගේ මෙම ඉල්ලීම සලකා බැලීමට සිදු වූ අතර එම ලිපියේ දක්වා තිබූ කරුණු පිළිබඳවද අවධානය යොමු කර රෝගී සත්කාර සේවය සඳහා සහ COVID වසංගත තත්වයෙන් ආරක්ෂා වීම සඳහා මෙම මිල වැඩි කිරීම ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර ඇත.<br><br>ටෙන්ඩර් කොන්දේසි වල මිල වැඩි වීමක් අනුමත නොකරන බව දක්වා තිබුනද මෙම කාලය තුල ලෝකයේ පැවති වාතාවරණය මත මෙය සිදු කල යුතු විය. එහිදී මිල ගණන් පිළිබඳ අවදානය යොමු කිරීමට වඩා එම කාලය තුල ඒ සඳහා වූ අවශ්‍යතාවය සලකා බලා ඇත. කෙසේ වුවද මෙම වියදම් රෝගීන්ගෙන් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත. |
| | (ආ) | දත්ත ස්කෑන් කිරීමට, සමාජ මාධ්‍යගතකරණයට හා කාර්යමණ්ඩල දීමනා ආදිය සඳහා විද්‍යුත් ලිපිලේඛන කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පරිගණක මෘදුකාංගයක් මිලදී ගැනීමට අදාළව 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී රු. මිලියන 21.56 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, 2020 දෙසැම්බර් 31 දින | මෙම ඇඳ ඉහපත් ස්කෑන් කිරීමේ කාර්යයට අදාල ප්‍රසම්පාදන කාර්යයේ කිසියම් අක්‍රමිකතාවයක් සිදුව ඇති බවට නැගෙන චෝදනා පදනම්ව ඒ පිළිබඳ විමර්ශනය සඳහා මූල්‍ය අපරාධ කොට්ඨාශය, ජනාධිපති කොමිසමක් ඇතුළු තවත් අංශ කිහිපයකින් පරීක්ෂණ ගණනාවක් අරඹා ඇත. ඒ තත්වය මත එවකට සභාපතිතුමාගේ අත්සනින් යුතු ලිපි |

| | | | |
|---|---|---|---|
| | | වන විටත් අදාළ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් මෙම පරිගණක පද්ධතිය භාවිතාකර නොතිබුණු හෙයින් මේ සඳහා දරන ලද පිරිවැය නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | දෙකක් මගින් මෙම ඇඳ ඉහපත් ස්කෑන් කිරීමේ කාර්ය තාවකාලිකව නවතා ඇත. අදාල පරීක්ෂණ වල නිර්දේශ (සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කළ මූලික විමර්ශනය හැර) තවමත් ලැබී නොමැත. තවද මෙම ස්කෑන් කරන ලද ලේඛනයන්හි ලබා ගන්නා පරිගණක මුද්‍රිත පිටපත් වල නිත්‍යානුකූල වලංගුභාවය පිළිබඳ රෝහල් සභාපති තුමා විසින් ගරු නීතිපති තුමාගේ උපදෙස් ලිඛිතව ඉල්ලා සිටින ලදි. ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ලිපියක් 2020.06.11 දින රෝහල වෙත යොමුකර ඇත. එම ලිපියේ කරුණු අනුව ස්කෑන් කරන ලද ලේඛන මුලික ලේඛන ලෙස නිත්‍යානුකූලව පිළිනොගන්නා බව දක්වා ඇත.<br>ඒ අනුව ඇඳ ඉහපත් ස්කෑන් කිරීමේ කාර්යය තවදුරටත් සිදුකරගෙන යාම නිත්‍යානුකූල පිළි නොගන්නා කාරණයක් බැවින් එම ක්‍රියා දාමය නවතා දැමීමට සිදුව ඇත.<br>එසේ වුවද ස්කෑන් කරන ලද ඇඳ ඉහපත් ආසන්න වශයෙන් දෙලක්ෂ පනස්දහසක් පමණ (ආසන්න වශයෙන් පිටු ලක්ෂ හැත්තෑ දෙකක් පමණ) පරිගණක දත්ත ගබඩාවේ දැනටමත් ගබඩා වී ඇති බව වෛද්‍ය වාර්තා නිළධාරීගේ වාර්තා තහවුරු කර ඇත. මෙවැනි පරිගණකගත රෝගී දත්ත ගබඩාවක් පැවතීම ඉතා දුර්ලභ කාරණයක් වන අතර මෙම දත්ත ගබඩාව ද භාවිතයට ගත හැකි වන අයුරින් රෝහල් පරිගණක වැඩසටහන යාවත්කාලීන කිරීම 2021.12.01 දින ජපාන තානාපති කාර්යාලයේ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් ආරම්භ කරන ලද අතර වෛද්‍ය සායනයේ හා දියවැඩියා රෝගීන්ගේ සායනයේ මෙම නව ක්‍රමවේදය ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව රෝගී තොරතුරු ස්කෑන් කර පරිගණක ගත කරනවා වෙනුවට රෝගී තොරතුරු සෘජුව පරිගණකය වෙත ඇතුලත් කිරීම මඟින් ස්කෑන් කිරීම සඳහා වැයවන වියදම ඉතිරි කර ගැනීමට ද හැකිවී ඇත.<br>මේ අනුව ස්කෑන් කරන ලද රෝගීන්ගේ ඇඳ ඉහපත් හි තොරතුරු රෝහල් පරිගණක දත්ත ගබඩාවේ භාවිතයට ගත හැකි අයුරින් පවතින බැවින් ද වර්තමාන රෝගී තොරතුරු පරිගණක ගත කිරීමත් සමඟම එම ස්කෑන් කරන ලද තොරතුරු ද |

| | | | |
|---|---|---|---|
| | | | පරීක්ෂා කිරීම සිදු කරන බැවින්ද රෝගී ඇඳ ඉහපත් ස්කෑන් කිරීම සඳහා වැය කරන ලද රු. 21,558,901 ක් වූ වියදම නිශ්කාර්ය වියදමක් වී නොමැති බව සඳහන් කරමි. |
| | (ඇ) | ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා අපේක්ෂිත විදේශ අරමුදල් ලබාගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව සයමහල් ගෙවන වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීමේ මූලික සැලසුම් කටයුතු සඳහා 2017 අප්‍රේල් 08 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත එකතු කළ අගය මත බදු සහිතව උපදේශන සේවා ගාස්තු ලෙස රු. මිලියන 5.76 ක් ගෙවා තිබුණි. නමුත් 2020 හා 2021 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලසුම් වලින් මෙම ව්‍යාපෘතිය ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මකවීම අවිනිශ්චිත බැවින් වැය කළ රු. මිලියන 5.76 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්විය හැකි බව නිරීක්ෂණය විය. | සයමහල් ගෙවන වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ රෝහල මගින් ලබා දෙනු ලබන රෝගී සත්කාරක සේවාවන්ගේ ගුණාත්මකභාවය ඉහල නැංවීමේ අරමුණින් හා ගෙවන වාට්ටු / කාමර සඳහා ඇති ඉහල යන ඉල්ලුමට සරිලන සේවා සැපයීමේ අරමුණින්ය. මෙම ව්‍යාපෘතියේ මූලික සැළැස්ම හා යෝජනාව සෞඛ්‍ය අමාත්‍යාංශයේ සැලසුම් අංශය මගින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (Department of National Planning) වෙත උපදෙස් හා නිරීක්ෂණ සඳහා යොමු කරන ලදී. එම කාර්යය සම්පූර්ණ වී නොතිබූ බැවින් ඒ වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර නොතිබුණි. මෙම කාලය අතරතුර රජයේ මූල්‍ය තත්වය අනුව යමින් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීමට රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතිය 2020 හා 2021 ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කරන ලදී. නමුත් මූල්‍ය ප්‍රතිපාදන තත්වය සතුටුදායක වූ විටෙක මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ බලාපොරොත්තුවක් ඇති බැවින් අදාල මූලික කටයුතු වෙනුවෙන් ගෙවා ඇති එම මුදල නිෂ්කාර්ය වියදමක් නොවන බව කිව හැක. |
| | (ඈ) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සූර්ය බලශක්ති පද්ධති (Solar Energy Panels ) ව්‍යාපෘතිය සඳහා උපදේශක ගාස්තු වශයෙන් රු. මිලියන 2.97 ක් 2018 වර්ෂයේ දී මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට ගෙවා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් ගෙවිය යුතු මුදල රු. 372,803 ක් විය. නමුත් 2020 හා 2021 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලසුම් වලින් මෙම ව්‍යාපෘතිය ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මකවීම අවිනිශ්චිත බැවින් වැය කළ රු. මිලියන 2.97 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්විය හැකි බව නිරීක්ෂණය විය. | සූර්ය බලශක්ති ව්‍යාපෘතියද රජයේ මූල්‍ය තත්වය අනුව යමින් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීමට රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතිය 2020 හා 2021 ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කරන ලදී. නමුත් මූල්‍ය ප්‍රතිපාදන තත්වය සතුටුදායක වූ විටෙක මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ බලාපොරොත්තුවක් ඇති බැවින් අදාල මූලික කටයුතු වෙනුවෙන් ගෙවා ඇති එම මුදල නිෂ්කාර්ය වියදමක් නොවන බව කිව යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2.3 | වෙනත් කරුණු | |
| | (අ) | මහාරෝග්‍යශාලා මණ්ඩලය පිහිටි එම මණ්ඩලය සතු ඉඩමට අදාළ ඔප්පුව ප්‍රකාරව, සර්වෙයර් ජනරාල් (Surveyor General) විසින් 1981 දී හා 1983 දී සහතික කර තිබුණු පිඹුරුපත් 03 ක් යටතේ පවතින ඉඩම් කොටස්හි හෙක්ටයාර් 10.0229 ක මුළු භූමි ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය විය. ඉන් එක් පිඹුරුපතක ඇතුළත් හෙක්ටයාර් 9.9469 ක භූමි ප්‍රමාණය සර්වෙයර් ජනරාල් වෙතින් 2015 වර්ෂයේදී නැවත මිනුම් කරවා ගෙන තිබුණි. එදින වන විට මණ්ඩලයේ පරිහරණය සඳහා පැවති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 9.8047 ක් පමණක් බවත්, ස්ථාන 09 කට අදාළව හෙක්ටයාර් 0.1422 ක භූමි ප්‍රමාණයක් අනවසර පදිංචිකරුවන් විසින් පරිහරණය කරන බවත් සර්වෙයර් ජනරාල් විසින් හඳුනාගෙන වාර්තා කර තිබුණද ඒ සම්බන්ධයෙන් සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගැනීමට 2015 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල පිහිටි ඉඩමට අදාල පහත අංක දරණ පිඹුරුපත් විගණන අධිකාරි වෙත 2021.10.25 වන දින ලබා දී ඇත.<br><br>1. සර්වේ ජනරාල් විසින් අදින ලද කො/5493 දරණ 1981.02.25 දිනැති පිඹුරේ කැබලි අංක 01 සිට 20 දක්වා වන ඉඩම් ප්‍රමාණය වන අ: 24 රූ: 2 පර්: 9.4 (හෙ: 9.939)<br><br>2. සර්වේ ජනරාල් විසින් අදින ලද කො/6073 දරණ 1983.07.20 දිනැති පිඹුරේ කැබලි අංක 01 වන ඉඩම් ප්‍රමාණය වන හෙ: 0.0380<br><br>3. සර්වේ ජනරාල් විසින් අදින ලද කො/6074 දරණ 1983.07.13 දිනැති පිඹුරේ කැබලි අංක 01 වන ඉඩම් ප්‍රමාණය වන හෙ: 0.0380<br><br>තවද මෙම ගැටළුව 2021.07.29 දින පැවති 453 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ද සාකච්ඡා කර ඇති අතර එහිදී තීරණය කර ඇත්තේ මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා ගැනීමටත් නැවත ඉඩමේ මැනුම් කටයුතු සිදුකරන ලෙසත්ය.<br><br>ඒ අනුව මේ සම්බන්ධයෙන් නීතිපති විසින් උපදෙස් දී ඇත්තේ කො/9523 දරණ පිඹුර පිළියෙල කිරීමේදී කොටසක් මගහැරී ඇත්නම් ඒ මන්ද යන්න පිළිබඳව කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයාගෙන් විමසා අවශ්‍ය නම් ඒ වරද නිවැරදි කිරීම සඳහා නැවත මිනුමක් ලබා ගන්නා ලෙසත් ඔප්පු අංක 805 ප්‍රකාරව අනවසරයෙන් අල්ලාගෙන ඇති ඉඩම් කොටස් ලෙස හඳුනාගෙන ඇති හෙ.0.1422 සඳහා 1979 අංක 7 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්ය.<br><br>තවද 2022.01.06 වන දින සර්වේයර් ජනරාල් වෙත ලිපියක් යවමින් 2015.03.18 වන දින කො/9523 දරණ පිඹුර සකස් කිරීමේදී කොටසක් මගහැරී ඇත්නම් ඒ මන්ද යන්න පිළිබඳව දැනුවත් |

| | | | |
|---|---|---|---|
| | | | කරන ලෙසත් එසේ මගහැරී ඇති බව තහවුරු වේ නම් එම වරද නිවැරදි කිරීමට නැවත මිනුමක් කර දෙන ලෙසත් දැනුම් දී ඇත. |
| | (ආ) | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්මික පුහුණු වැඩසටහන් ස්ථාපිත කිරීමේ අරමුණින් එවකට තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනාවක් අනුව මහාරෝගාශාලා මණ්ඩලය, තරුණ කටයුතු නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ 2013 මැයි 09 දින එළඹි අවබෝධතා ගිවිසුමක් මත සෞඛ්‍ය වෛද්‍ය අධ්‍යයන විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ආරම්භ කර තිබුණි. 2016 මැයි වන විට ගිවිසුම අවසන්ව තිබුණද එතෙක් පාඨමාලා අවසන් නොකළ ශිෂ්‍යයන් වෙනුවෙන් විද්‍යායතනය පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු අතර සෞඛ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි විද්‍යායතනය වෙත රු. මිලියන 3.8 ක් දක්වා මූල්‍ය පහසුකම් සැපයීමටත්, එම මුදල එවකට සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණයකර ගැනීමටත් අපේක්ෂාකර තිබුණද, 2016 වර්ෂයේ සිට 2019 වර්ෂයේ අවසානය දක්වා රෝහල විසින් වැයකර තිබුණු රු. මිලියන 8.94 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට නොහැකි වී තිබුණි. | රෝහලේ පාලනාධිකාරිය විසින් හිඟ මුදල් අයකර ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ලිපි ගණුදෙණු සිදුකරමින් උපරිමයෙන් කටයුතු කර ඇත. මෙය අදාල කාලය තුල ගරු ඇමතිතුමාගේ නියෝග මත සිදුකර ඇති වියදමක් වන අතර අදාල මුදල අමාත්‍යාංශයෙන් අයකර ගැනීමට පාලනාධිකාරිය විසින් දිගටම කටයුතු කරනු ඇත. |
| | (ඇ) | විශේෂඥ වෛද්‍යවරුන් සිය රාජකාරි වේලාවෙන් පසු සිදුකරනු ලබන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා මහාරෝගාශාලා මණ්ඩලය විසින් මාසිකව රු. 581,418 ක් පමණ පොදුකාර්ය පිරිවැය ලෙස වැය කරන බව හඳුනාගෙන තිබුණි. නමුත් එම ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා අය කරනු ලබන වෘත්තීය ගාස්තුවලින් සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකිරීමේ ක්‍රමවේදය මත සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු. මිලියන 363.17 කින් අයකර තිබුණු මුළු සේවා ගාස්තුව රු.546,035 ක් පමණක් විය. සේවා ගාස්තුව වැඩි කිරීම සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 25 දින අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා ඉදිරිපත්කර තිබුණද සත්‍ය වශයෙන් වැයකරන පිරිවැයට සාපේක්ෂව අය කරන සේවා ගාස්තුව වැඩිකර ගැනීමට මෙතෙක් අපොහොසත්වී තිබුණි. | වෘත්තීය ගාස්තු අය කිරීම සඳහා විශේෂඥ වෛද්‍යවරු විසින් පෞද්ගලික වෛද්‍ය සේවාවේ යෙදෙන අතර ඒ සඳහා රෝහලේ විශේෂ වාට්ටු වෙන් කර ඇත. ඒ අනුව එම ගෙවන වාට්ටු වන 03,04 සහ 05 යන වාට්ටු වලට රෝගීන් ඇතුලත් වීම සිදුවේ. බොහෝ අවස්ථාවල එම වාට්ටු වල ඇඳන් සංඛ්‍යාව 100% ක්ම උපයෝජනයෙහි පවතී.<br><br>මෙහිදී ගෙවන වාට්ටු වල කාමරයකට හෝ ඇඳකට වෙනම අය කරන ගාස්තුවට (රු.2000, රු.3000, රු.4000, රු.5000, රු.7500) අමතරව රෝහලෙහි සාමාන්‍ය වාට්ටු වලට (10%) වඩා මෙම වාට්ටුවේදී රෝගීන්ට ලබාදෙන සේවාවන් සඳහා 30%ක ලාභ ප්‍රතිශතයක් තබා ගනිමින් රෝහල විසින් ගාස්තු අය කරනු ලබයි. ඒ අනුව රෝහල් ගාස්තු , ඖෂධ හා පාරිභෝජන ද්‍රව්‍ය ශල්‍යකර්ම ගාස්තු |

| | | | |
|---|---|---|---|
| | | | පරීක්ෂණ ගාස්තු යනාදිය වෙනුවෙන් රෝහලට ඉහල ආදායමක් ලැබේ. වෘත්තීය ගාස්තු වලින් 0.15% ක ගාස්තුවක් රෝහලට අයකරනු ලබන්නේ ඊට අමතර වශයෙනි. මෙම ගාස්තුව, වෘත්තීය ගාස්තු සම්බන්ධ පරිපාලන ගාස්තුවක් පමණි. |
| | (ඇ) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ පවතින තොග සම්බන්ධ පරිගණක පද්ධතියේ තොරතුරු ගිණුම්කරණ පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවත ගිණුම්කරණ පද්ධතිය තුළ යාවත්කාලීන නොකළ අවස්ථා නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. මේ හේතුවෙන් ගිණුම්කරණ පරිගණක පද්ධතිය තුළ පවතින ගැනුම් පරිවැය, ණයහිමියෝ, ණයගැතියෝ සහ රෝහල් ගාස්තු ආදායම යන අයිතමයන්ගේ සත්‍ය අගයන් මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපනය වන්නේද යන්න පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. රෝහලේ පවතින පරිගණක පද්ධති යාවත්කාලීන නොකිරීම, පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (System Link) ඇතිකර නොතිබීම හා පරිගණක පද්ධතියේ දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීම මීට හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය. එසේම මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමෙන් පසුව පද්ධතියේ ඇතුළත් වාර්තා වෙනස් කිරීමට ඇති පහසුකම අහුරා තැබිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. | ඉහත ප්‍රශ්නය සිදුවනුයේ ''Systolic System '' හි සිදුවන වෙනස්කම් ''Acc Pac '' පද්ධතියේ යාවත්කාලීන නොවීම හේතුවෙනි. විගණනය විසින් පෙන්වා දී ඇති වැරදි ඔවුන් විසින් දක්වා ඇති කාලපරිච්ඡේදය තුල සිදුව ඇති බව පිළිගන්නා අතර එම වැරදි 2021 වසරේ අග කාර්තුවේ දී අප විසින් සොයා ගත් අතර එම වැරදි පද්ධතියේ මේ වන විට නිවැරදි කර ඇති බව දන්වමි.<br>තවද මෙම පද්ධති දෙකේ ඇති වැරදි සොයා ගැනීම සහ ඒවා නිවැරදි කල යුතු ආකාරය ඇතුළු පරිගණක කටයුතු සඳහා උපදෙස් ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිගණක විශේෂඥ උපදේශකවරයෙකු පත් කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර ඔහුගේ නිරීක්ෂණ වාර්ථාවෙන් පසු ඉහත පද්ධති දෙක අතර ඇති වැරදි අවම කිරීමට පියවර ගනු ඇත. |
| | (ඉ) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ වෛද්‍ය නිලධාරිනියකට 2018 මැයි 30 දින සිට ජූලි 11 දක්වා වූ කාලය තුළදී වැටුප් රහිත විදේශගත පුහුණුවක් සඳහා එක්සත් රාජධානියේ Oxford විශ්ව විද්‍යාලයට යාමට ශිෂ්‍යත්වයක් ලැබී තිබුණි. වෛද්‍ය නිලධාරිනියගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් ගෙවීමට අදාළ නීත්‍යානුකූල භාවය පිළිබඳ කරුණු විමසීමෙන් තොරව හා නිලධාරිනිය විසින් ඉදිරිපත් කරන ලද විදේශ ශිෂ්‍යත්ව අයදුම් පත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබිය දී එම නිලධාරිනියට ශිෂ්‍යත්වය සඳහා විදේශගත වීමට වර්ෂ 2 ක් වැටුප් සහිත නිවාඩු හා පෞද්ගලික වියදම් දීමනාවක් (Personal Maintenance Allowances) | නියෝජ්‍ය අධ්‍යක්ෂ, සන්තුෂ්‍යා ප්‍රනාන්දු මිය එක්සත් රාජධානියේ ශිෂ්‍යත්වය නිමවා දිවයිනට පැමිණීමෙන් පසු 2021 ජුනි 17 දින සේවයෙන් ඉල්ලා අස්වීම දක්වා කාල පරිච්ඡේදය මෙම රෝහලට සේවය කර ඇත. එමෙන්ම ඇය ශ්‍රී ජයවර්ධනපුර රෝහලෙහි සේවයෙන් ඉවත්ව ගියද මෙම ශිෂ්‍යත්වය වෙනුවෙන් අත්සන් කර තිබූ ඇප බැඳුම්කරය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මාරු කර යවා ඇත. ඒ අනුව එහි සඳහන් කොන්දේසි තවදුරටත් බල පැවැත්වේ. |

| | | | |
|---|---|---|---|
| | | ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. මේ හේතුවෙන් පෞද්ගලික වියදම් දීමනාව ලෙස ගෙවා තිබුණු රු. මිලියන 5.80 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගත නොහැකිවී තිබුණ අතර එම මුදල හා වේතන ලෙස ගෙවූ රු. මිලියන 3.79 ක් රෝහලට වැය බරක්වී තිබුණි. | |
| | (ඊ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා තනතුරු 3 ක් සඳහා නිලධාරීන් 251 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිකින් තොරව, මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු 05 ක් සඳහා 10 දෙනෙකු පත්කර තිබුණි. | රෝහල් කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ අරමුණෙන් මෙම කාළ සීමාව තුල රෝහලේ පැවති එකී තනතුරු වල පුරප්පාඩු පිරවීමේ අත්‍යවශයතාව හේතුවෙන් එම පුරප්පාඩු පිරවීම සිදුකල අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීම සිදුකර ඇත.<br>එසේ නමුත් ඉදිරියේදී යෝජිත බඳවා ගැනීමේ පරිපාටියට අනුමැතිය ලබා ගැනීමේදී මෙම සියලු තනතුරු නාම ආවරණය වනු ඇත. |
| | (උ) | වර්ෂ 4 සිට වර්ෂ 23 ක කාලයක සිට පැවත එන එකතුව රු. මිලියන 5.73 ක්වූ ගෙවිය යුතු ශේෂ 16 ක් නිරවුල් කිරීමට හෝ වගකීමක් නොමැති ශේෂ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමේ සඳහන් වටිනාකමින් රු.571,830.04 ක අගයෙන් යුතු ණය හිමියන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව 2021 මුල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර ඇත. අනෙකුත් ණය හිමියන් සම්බන්ධ විස්තරාත්මක වාර්තා පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාල ගැලපුම් 2021 වර්ෂයේදී සිදු කෙරෙනු ඇත. |

# 6. ඉදිරි දැක්ම



# 6.1 ආයතනයේ කාර්යසාධන වර්ධනය සඳහා අපේක්ෂිත මධ්‍යම කාලීන ක්‍රියාකාරකම්

| අරමුණු | ක්‍රියාකාරකම් |
|---|---|
| නව ගොඩනැගිලි ඉදිකිරීම් | ♦ සීටී ඇන්ජියෝ යන්ත්‍රය සඳහා වූ ගොඩනැගිල්ල<br>♦ පරිපාලන ගොඩනැගිල්ල සඳහා ඊඑල්යූ (ELU) පද්ධතියක් සමගින් (ගැහැණු සහ පිරිමි වෙද නිල නිවාස, පරිපාලන ගොඩනැගිල්ල සහ කම්හල) ඇතුළාන්ත වැඩ සහ ගෘහභාණ්ඩ සැපයීම |
| පවත්නා යටිතල ව්‍යුහය පුනරුත්ථාපනය | ♦ පවත්නා සනීපාරක්ෂක පහසුකම් නැවත සැකසීම (ක්‍රියාත්මක ව පවතී)<br>♦ ප්‍රධාන පොම්පාගාරය නැවත සැකසීම<br>♦ ජනක යන්ත්‍ර ඇතුළුව බලශක්ති සැපයුම ඉහළ නැංවීම හා දීඝී කිරීම<br>♦ විවාහක වෛද්‍ය නිල නිවාස අලුත්වැඩියා කිරීම<br>♦ වායුසමීකරණ පද්ධතිය අළුත්වැඩියා කිරීම (කන්තුක ගොඩනැගිල්ල)<br>♦ විකලාංග ප්‍රතිකාර සංකීර්ණය සඳහා වූ වායුසමීකරණ පද්ධතිය නැවත සැකසීම (ඉතිරි ව ඇති වැඩ කටයුතු)<br>♦ පවත්නා පුද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරු පද්ධතිය ඉහල නැංවීම.<br>♦ උරස් කන්තුක ශල්‍යාගාරය සඳහා මළනොකන වානේ දොරවල්<br>♦ වාට්ටුවල අනෙකුත් පුනරුත්ථාපන කටයුතු හා වැඩිදියුණු කිරීම් |
| උපකරණ සම්පාදනය | .<br>♦ කන්තුක කැතීටරකරණ රසායනාගාරය සඳහා උපකරණ මිල දී ගැනීම<br>♦ ජෛව වෛද්‍ය, ශල්‍ය, රසායනාගාර උපකරණ මිල දී ගැනීම<br>♦ කාර්යාලීය ගෘහභාණ්ඩ, සවිකිරීම් හා අනෙකුත් උපකරණ |